ඩී.එස්. සේනානායක විද්‍යාලය කොළඹ 07.

# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.
## දෙවන වාර පරීක්ෂණය - 2015
## 6 ශ්‍රේණිය
## බුද්ධ ධර්මය

**කාලය පැය 2 යි.**

නම: ................................................................................................ අංකය:- ................. පන්තිය:- ..........

<u>නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.</u>

I) ප්‍රශ්න අංක. 1-20 දක්වා එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 40 කි.

II) පළමු කොටසට ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයා දෙවන කොටසට අමුණා භාර දෙන්න.

### <u>පළමුවන කොටස</u>

- **පහත සඳහන් ප්‍රකාශ හරි නම් ✓ ලකුණ ද, වැරදි නම් × ලකුණ ද ඉදිරියේ ඇති කොටුව තුළ ලකුණු කරන්න.**

01) ඇසළ පෝය දා මහාමයා දේවිය පෙහෙවස් සමාදන් වී දුගී, මගී, යාචකාදීන්ට දන් දෙමින් කල්ගත කළාය. ( )

02) "පංචමහාවිලෝකනය" නමින් හැඳින්වෙන්නේ පස්මහ බැලුම් ය. ( )

03) වප් මගුල් දා සිදුහත් කුමරා දඹගස යට සිට මෛත්‍රී භාවනාව වඩන ලදී. ( )

04) නන්ද හා කාළුදායි යන දෙදෙනා සිදුහත් කුමාරු සමග එකට හැදුණු වැඩුණු කුමාරවරු දෙදෙනෙකි. ( )

05) සිදුහත් කුමරාට පිය රජතුමා දෙවන වර වැන්දේ වප් මගුල් දා ය. ( )

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

06) මගේ අදහස ඉටුවූවා සේ ඔබගේ අදහස ද ඉටුවේවායි ප්‍රාර්ථනා කළේ (විශාඛාව / සුජාතාව) විසිනි.

07) සිදුහත් තාපසයාණෝ (නෙරංජනා / අචිරවති) ගඟ අසල වනයේ සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කළහ.

08) මෛත්‍රී කරන්නෙකුට ලැබෙන ආනිසංස (එකොළහකි / දහයකි)

09) ගිහියාගේ නිත්‍ය සීලය (අටසිල් / පන්සිල්) ය.

10) භාවනා කිරීමේ දී පිරිමි අය ඉඳ ගන්නේ (අර්ධ පර්යංකයෙනි / බද්ධ පර්යංකයෙනි).

- **පහත දැක්වෙන "අ" කොටසට අයත් වගන්ති හා සැසඳෙන පිළිතුර "ආ" කොටසින් තෝරා යා කරන්න.**

| | "අ" | "ආ" |
|---|---|---|
| 11) | රාහුල හිමි | සොත්ථිය බමුණා |
| 12) | පංචවිලෝකනයෙන් එකකි. | කාමසුකල්ලිකානුයෝගය යි. |
| 13) | පංච ඉන්ද්‍රියන් පිනවීම. | දේශය |
| 14) | කුසතණ පූජා කිරීම. | වප් මගුල් දා |
| 15) | ආනාපානසතිභාවනාව වැඩීම. | අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය |

- **පහත සඳහන් 1, 2, 3, 4 යන පිළිතුරු වලින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

16) "තමා සොයා යන උතුම් බුද්ධත්වය ලබා ගැනීමෙන් පසුව පළමුව මගේ රාජ්‍යයට වඩින්න" මෙසේ බෝසතාණන් වහන්සේගෙන් ඉල්ලීමක් කළ රජතුමා,

1) බිම්බිසාර රජු ය. 2) අජාසත් රජු ය.

3) කොසොල් රජු ය. 4) සුද්ධෝදන රජු ය.

The National e-Learning Portal for The General Education

17) දෙමාපියන් හා දරුවන් අතර හොඳ සම්බන්ධතාවයක් පැවැත්විය යුතු යැයි අපට කියා දෙනු සූත්‍රයකි.
 1) කරණීය මෙත්ත සූත්‍රය  2) අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය
 3) සිගාලෝවාද සූත්‍රය  4) රතන සූත්‍රය

18) සිදුහත් කුමරු මව්කුස පිළිසඳ ගත්තේ,
 1) පොසොන් පෝදා ය.  2) ඇසළ පෝදා ය.
 3) වෙසක් පෝදා ය.  4) නිකිණි පෝදා ය.

19) විහාරස්ථානයකට ගොස් පළමුව වඳින්නේ,
 1) බෝධීන් වහන්සේට ය.  2) පිළිම වහන්සේට ය.
 3) වෙහෙර වහන්සේට ය.  4) මේ එකකටවත් නොවේ.

20) රාහුල පොඩි හාමුදුරුවන්ගේ ගුරුවරයා,
 1) මුගලන් මහ රහතන් වහන්සේ ය.  2) යස මහ රහතන් වහන්සේ ය.
 3) සැරියුත් මහ රහතන් වහන්සේ ය.  4) මහා කස්සප මහ රහතන් වහන්සේ ය.

(ලකුණු 20)

## දෙවන කොටස

**I) පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර එම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
**II) පළමු ප්‍රශ්නය ලකුණු 16 කි. ඉතිරි ප්‍රශ්න 4 ට ලකුණු 11 බැගින් (11 x 4 = 44) ලකුණු 44 කි.**

2015 වර්ෂයේ දෙවන වාරය සඳහා ඔබ නිරතවූ ඇගයීම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01) 1) ඇගයීම සඳහා යොදාගත් පාඩම් දෙකක් නම් කරන්න. (ලකුණු 2)
 2) ඔබ නිරත වූ ඇගයීම ලියා දක්වන්න. (ලකුණු 2)
 3) විහාරස්ථානයකට පිවිසීමේ දී අප විසින් මුලින් කළ යුතු කාර්යයන් මොනවාද? (ලකුණු 2)
 4) විහාරස්ථානයට පිවිසීමෙන් පසුව කළ යුතු වතාවත් තුනක් ලියා දක්වන්න. (ලකුණු 3)
 5) මෙම කාර්යයේ දී ඔබට ගුරුතුමාගෙන්, ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 2)
 6) ඔබ මෙම කාර්යයේ නිතර වන විට මුහුණපාන්ට වූ ගැටළු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
 7) මෙම ප්‍රායෝගික ක්‍රියාවලියෙන් පසුව ඔබ තුළ ගොඩ නගා ගත් යහපත් ගුණ ධර්ම තුනක් නම් කරන්න. (ලකුණු 3)

02) 1) නරසීහ ගාථා සජ්ඣායනා කරමින් බුදු රජාණන් වහන්සේගේ ගුණ වර්ණනා කළේ කවුද? (ලකුණු 2)
 2) දිනපතා වැලි දෝතක් අතට ගෙන අහසට විසිකර රාහුල හිමියන් ප්‍රාර්ථනා කළේ මොනවාද? කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 3)
 3) රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතය තුළින් ඔබට ගත හැකි ආදර්ශ හතරක් ලියා දක්වන්න. (ලකුණු 6)

03) 1) ත්‍රිශික්ෂාවලින් දෙකක් නම් කරන්න. (ලකුණු 2)
 2) සීලය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 3)
 3) කෙනෙකු සිල්වත් වීමෙන් ලැබෙන ආනිසංස මොනවාද‍යි පෙළ ගස්වන්න. (ලකුණු 6)

04) 1) බෞද්ධයාගේ නිත්‍ය සීලය කුමක් ද? (ලකුණු 2)

2) ත්‍රිකෝටිපාරිශුද්ධි සීලය නම් කරන්න. (ලකුණු 3)

3) පහත සඳහන් කවිය සම්පූර්ණ කරන්න.

කිසිම සතෙකු නොමරමි මම නොමරවමි.

.....................................................................................................

.....................................................................................................

..................................................................................................... (ලකුණු 6)

05) 1) සිගාලෝවාද සූත්‍රයෙන් පෙන්වා දී ඇති පරිදි දෙමාපියන් අයත් වන්නේ කුමන දිසාවට ද? (ලකුණු 2)

2) සතර බ්‍රහ්ම විහරණ වලින් තුනක් නම් කරන්න. (ලකුණු 3)

3) දෙමාපියන් විසින් දරුවන්ට ඉටු කරනු ලබන යුතුකම් පහකි. ඒ මොනවාද? ලියා දක්වන්න. (ලකුණු 6)

06) 1) මඝ මානවක විසින් ආරක්‍ෂා කරන ලද සීලය කුමක් ද? (ලකුණු 2)

2) මොහුගේ චරිතයෙන් අපට ලබා ගත හැකි ආදර්ශ තුනක් ලියා දක්වන්න. (ලකුණු 3)

3) මේ මානවකයා විසින් ආරක්‍ෂා කරන ලද වත් සතකි. ඉන් පහක් ලියා දක්වන්න. (ලකුණු 6)

07) 1) හොඳ නරක මැන බැලීම සඳහා රාහුල හිමිට දේශිත සූත්‍රය කුමක් ද? (ලකුණු 2)

2) හොඳ නරක හඳුනා ගන්නා මිනුම් දඬු තුනකි. නම් කරන්න. (ලකුණු 3)

3) ඔබ විසින් කර තිබෙන හොඳ ක්‍රියාවන් මොනවාද? පෙළ ගස්වන්න. (ලකුණු 6)

e තක්සලාව අධ්‍යාපන The National e-learning Portal for The General Education

********